**ශීර්ෂය 160 පරිසර අමාත්‍යාංශය**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

පරිසර අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහනුවර, බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි නිසරු කෘෂිකාර්මික ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පෞද්ගලික ඉඩම් වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.1,179,220 ක් වැය කර තිබුණි. එම වියදම අමාත්‍යාංශයේ ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම යටතේ දැක්වීම හේතුවෙන් අමාත්‍යාංශය සතු වත්කම් අගය වැරදි ලෙස නිරූපණය වේ. | මෙම ව්‍යාපෘතිය ආරම්භයේ සිටම වැය විෂයය සංකේත අංකය 2015 ලෙස ලබා දී තිබූ බැවින් ඉඩම් වැඩි දියුණු කිරීම යටතේ එම ව්‍යාපෘතියේ වියදම වාර්ෂිකව ගිණුම් වාර්තා වල පෙන්නුම් කරයි. මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන විට භාණ්ඩාගාරය මගින් මෙම සංකේතාංකය යටතේ අයවැය ප්‍රතිපාදන ලබා දී තිබූ බැවින් මේ දක්වාම එම වැය විෂයය යටතේ වාර්ෂිකව ප්‍රතිපාදන වෙන්වෙන අතර වියදම එම වැය විෂයය යටතේ ගිණුම් ගත කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය මේ වන විට අවසන් වී ඇත. | පෞද්ගලික ඉඩම් වෙනුවෙන් දරන ලද වියදම අමාත්‍යාංශයේ ඉඩම් ලෙස දැක්වීම නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු.261,000,000 ක් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට හා ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ සොබාදම් පියස ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම රු.මිලියන 261 ලෙස මූල්‍ය ප්‍රකාශන වල සටහන් වී නොමැති අතර ගොඩනැගිල්ලේ වටිනාකම ලෙස මූල්‍ය ප්‍රකාශන වල සටහන් වී ඇති වටිනාකම රු.1,013,366,589 කි. මෙම වටිනාකම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී මේ දක්වා කොන්ත්‍රාත්කරුට ගෙවා ඇති මුදල වන අතර එම වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් වේ. | ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට හා ඉඩමේ තක්සේරු අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ කළමනාකරණ සේවයේ නිලධාරියෙකු විසින් සිදු කර තිබූ වංචාවක් සම්බන්ධයෙන් ඔහුගෙන් අයවිය යුතුව තිබූ රු.260,361 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. එම මුදල විගණිත දිනය වූ 2022 අප්‍රේල් 08 වන විටත් අයකර ගෙන නොතිබුණි. | එම මුදල පරිසර අමාත්‍යාංශය නමින් චෙක්පතක් මගින් ලැබීමට සලස්වන මෙන් නිලධාරියා දැනට සේවය කරන ආගමන විගමන දෙපාර්තමේන්තුවේ ආගමන විගමන පාලක ජනරාල් වෙත දන්වන ලදී. | මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 2.2 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හයිඩ්‍රොක්ලෝරෆ්ලෝරා කාබන් ශීතකාරක ආනයනයට අදාල කෝටා බලපත්‍ර නිකුත් කිරීමේදී ආනයන ශීතකාරක කිලෝග්‍රෑමයකට රු.10ක් වශයෙන් රජයේ ගාස්තුවක් අමාත්‍යාංශය විසින් අයකර තිබුණු අතර 2021 වර්ෂය වෙනුවෙන් එකතු වූ මුළු රජයේ ගාස්තු ආදායම රු.1,560,394 ක් විය. මෙම ආදායම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණ ද වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව තුලට ඇතුලත් කර නොතිබුණි. | මොන්ට්‍රියල් සන්ධාන ව්‍යාපෘතිය මගින් ඉදිරි වර්ෂවල කෝටා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා අනෙකුත් කරුණු තවදුරටත් අධ්‍යනය කිරීමෙන් අනතුරුව මෙය ආදායම් ඇස්තමේන්තුවලට ඇතුලත් කිරීම සුදුසු බවට තහවුරු වන්නේ නම්, ඒ අනුව ඉදිරියේදී කටයුතු කරනු ඇත. | රජයේ ආදායම් ඇස්තමේන්තුව තුළ හඳුනාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

## 2.3 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයන් 06 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු. 89,400,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | අවශ්‍යතාවයන් 2021 වර්ෂය තුල ඇති නොවීම, ඉල්ලීමක් නොලැබීම, BUR වාර්තාව සකස් කිරීමට වඩා පළමුව විනිවිදභාවය පිළිබඳ ද්විවාර්ෂික වාර්තාව (Biennial Transparency Report-BTR) සකස් කිරීම වඩා උචිත බව නිර්දේශ කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ඇතිවූ ප්‍රමාද වීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නිදහස් කිරීම සඳහා එකඟතාවය ලබාදීම 2021 දෙසැම්බර් 27 දින සිදු වීම යන හේතූන් නිසා 2021 වර්ෂය තුල උක්ත ව්‍යාපෘතිය සඳහා වූ ප්‍රතිපාදන වැය කිරීමට හැකියාවක් නොමැති විය. | වියදම් සමාලෝචනයන් සිදු කරමින් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) වැය විෂයයන් 05 ක් වෙනුවෙන් ප්‍රතිපාදනය කරන ලද මුදල වූ රු.225,100,000 න් සියයට පනහකට වැඩි ප්‍රමාණයක් වියදම් නොකොට ඉතිරි කර ඇති අවස්ථා නිරීක්ෂණය විය. | අමාත්‍ය මණ්ඩලයේ තීරණ අනුව නව මිලදී ගැනීම් අත් හිටුවීමට සිදු වීම, ඉල්ලීමක් අදාල පලාත් පාලන ආයතනයෙන් නොලැබීම, කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම ප්‍රායෝගිකව සිදු නොවීම වැනි හේතු මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | වියදම් කලින් කල සමාලෝචනය කරමින් ඵලදායී ලෙස ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) මුදල් රෙගුලාසි 03 ට අනුව සැලසුම් හා වැඩසටහන් වල ඇතුළත් කාර්යයන් කලින් තීරණය කර ඒවා සිදු කළ යුතු වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත් පෙර රු. 19,350,000 ක් වටිනා ව්‍යාපෘති 03 ක් සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුනු අතර මෙම මුළු වටිනාකම ම 2021 වර්ෂයේ දෙසැම්බර් මස මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් ව්‍යාපෘති වලට මාරු කර තිබුණි. | 2020 වර්ෂය මුල් භාගයේදී මෙම ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සැපයීමට අදාල විදේශාධාර සපයන ආයතන එකඟතාවය පළ කරන ලදී. ඒ අනුව ව්‍යාපෘති වල කටයුතු සමාන්‍ය පරිදි ආරම්භ කරන ලදී. එසේ වුවද ජනාධිපති ලේකම්ගේ 2019 දෙසැම්බර් 19 දිනැති හා අංක **PS/SP /SB /Circular /**06/2019 දරන චක්‍රලේඛයට අනුගතවීමේදී විදේශ අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතු වූ අතර එහිදී විදේශ අමාත්‍යාංශය මගින් ගිවිසුම් වෙනස් කිරීමට උපදෙස් දෙන ලදී. ඒ සඳහා විදේශාධාර සපයන ආයතන එකඟ නොවූ බැවින් ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සිදුවූ අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබෙනතුරු ව්‍යාපෘති කටයුතු | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර පූර්ව අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කිසිවක් ක්‍රියාත්මක නොකරන ලදී . අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම ප්‍රමාද වූ බැවින් ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර වෙන් කරගන්නා ලද ප්‍රතිපාදන ඵලදායි ලෙස යොදා ගැනීම සඳහා වෙනත් ව්‍යාපෘතිවලට මාරු කරන ලදී. | |
| (ඇ) 2020 දෙසැම්බර් 23 දිනැති අයවැය චක්‍රලේඛ අංක 07/2020-2021 වියදම් දැරීම සඳහා බලය දීම සහ රාජ්‍ය වියදම් කළමණාකරණය යන චක්‍රලේඛයේ 03 වන ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේදී මුල් කාර්තුවේ සිට මිලදී ගැනීම් හා ගෙවීම් කිරීම් කිරීමට හැකිවන පරිදි කාර්යයන් සැලසුම් කල යුතු වේ. එහෙත් අවසාන කාර්තුවේ දී ගෙවීම් කිරීමට සිදු වන පරිදි සැලසුම් කිරීම හේතුවෙන් ද්‍රවශීලතා අපහසුතාවලට මුහුණ දීමට සිදු වන බව පැහැදිලි කර තිබුණි. එසේ වුවද 2021 වර්ෂයේ දී මුළු වියදමට සාපේක්ෂව පළමු කාර්තුවේ වියදම සියයට 16 ක් වුවද අවසාන කාර්තුවේදී මුළු වියදමින් සියයට 41 ක ප්‍රමාණයක් වැය දරා තිබුණි. තවද අමාත්‍යාංශය විසින් 2021 දෙසැම්බර් 31 දින පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනට අදාලව රු.15,541,881 ක් වටිනා බැරකම්වලට හා සුරකිමු ගංගා ජාතික පරිසර වැඩසටහනට අදාලව රු.18,195,039 ක් වටිනා බැරකම්වලට ද එළඹ තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු වර්ෂයේ මුල් කාර්තුවේ සිදු වන අතර ඇතැම් විට මුල් කාර්තුවේ ප්‍රගතිය අනුව දෙවන හා තෙවන කාර්තු වලද යම් යම් සංශෝධනයන් සිදුවේ. එබැවින්, මුල් කාර්තුවේ වියදම අඩු වීම සාමාන්‍ය තත්ත්වයක් වන අතර බොහොමයක් වැඩසටහන් අවසන් වීම වර්ෂයේ අවසන් කාර්තුව දක්වා දීර්ඝ වේ. වැඩසටහන් අවසන් වීමෙන් පසුව වවුචර්පත් පිළියෙල වීම හා ගෙවීම සිදු වන බැවින්, අවසන් කාර්තුවේ වියදම වැඩිවීම සාමාන්‍ය තත්ත්වයකි.<br><br>පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන යටතේ හා සුරකිමු ගංගා ජාතික වැඩසටහන යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පරිසර අමාත්‍යාංශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ට ප්‍රතිපාදන නිදහස් කර තිබූ බැවින් එම ප්‍රතිපාදන සීමාව දක්වා බැඳීම් වලට එළඹීමට හැකියාව පවතින අතර, භාණ්ඩාගාරයෙන් අක්මුදල් නොලැබී ඇති බැවින්, එම දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ලද තොරතුරු අනුව මෙම බැරකම් වාර්තා කර ඇත | වර්ෂය පුරාම වියදම් බෙදී යන ආකාරයට සැලැසුම් සකස්කර වියදම් දැරිය යුතුය. |
| (ඉ) ඉහත චක්‍රලේඛයේ 06 ඡේදය අනුව අමතර ප්‍රතිපාදන ලබා දීම ඉතා අසීරු බැවින් 2021 වර්ෂය තුල පැන නගින වියදම් ලබා දී ඇති ප්‍රතිපාදන හොඳින් ප්‍රමුඛතා ගත කරමින් කළමණාකරණය කර ගත යුතු වුවත් වැය විෂයය 160-2-3-145-2509 (ii) හා වැය විෂයය 160-2-6-146-2509(13) දෙකට අදාලව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී වර්ෂයේ අවසාන භාගයේ දිවයිනට බලපෑ දැඩි වර්ෂාපතනය හේතුවෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන සම්පූර්ණ වශයෙන් උපයෝගී කරගැනීමට නොහැකි වීම නිසා මෙම තත්ත්වය උද්ගත විය. | ලබා දී ඇති ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝජනය කළයුතු වේ. |
| **(ඊ)** වැය විෂයය අංක 160-2-3-118-2507(II) යටතේ වෙන් කරන ලද මුළු ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.මිලියන 20 ක් වූ අතර වර්ෂය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් වන බොහොමයක් වැඩසටහන් වර්ෂය මුල ආරම්භ කර වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක වන අතර එම වැඩසටහන් | වැඩසටහන්වල පසුවිපරම් කටයුතු අඛණ්ඩව කළ යුතුවීම හා ප්‍රතිපාදන |

| | | |
|---|---|---|
| අවසානය වන විට වියදම රු.මිලියන 1.6 ක ඉතිරියක් විය. උක්ත වැඩසටහනේ වියදම් පරීක්ෂාවේදී මුළු වියදමින් සියයට 75 ක වියදම 2021 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. | බොහෝ විට අවසන් වන්නේ වර්ෂයේ අවසාන මාස කීපයේදීය. එබැවින්, වර්ෂයේ අවසාන මාස කීපයේ වියදම වැඩි වීම හා අනෙකුත් මාස වල වියදම සාපේක්ෂව අඩු වීම සිදුවේ. | කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතුවීම. |

## 2.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

---------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 160-2-3124-2509(II) දරන වැය විෂයය යටතේ පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන මගින් පුද්ගලයින්, සමිති හා සංවිධාන සඳහා රු.15,451,881 ක බැදීම් හා බැරකම් වටිනාකමක් වාර්තා වී තිබුණි. තවද 160-2-3145-2509(II) යටතේ සුරකිමු ගංගා ජාතික පරිසර වැඩසටහන මගින් පුද්ගලයින්, සමිති හා සංවිධාන සඳහා රු.18,195,039 ක බැදීම් හා බැරකම් ලෙස විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබුණි. එහෙත් එම බැරකම් තහවුරු කර ගැනීම සඳහා අදාල ලිපිගොනු ව්‍යාපෘති අධ්‍යාපන අංශයේ නොතිබුණි. මෙම වැඩසටහන් සඳහා ගෙවීම් සිදුකිරීමේදී ඒ සම්බන්ධ පසු විපරම කිරීමක්ද අමාත්‍යාංශය මගින් සිදු නොවන බව විගණනයේදී තහවුරු විය. | සුරකිමු ගංගා ව්‍යාපෘති යෝජනා මගින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවලට අදාලව ප්‍රාදේශීය ලේකම් මගින් සිදු කෙරෙන වියදම් සුරකිමු ගංගා වැය විෂයයට හර කර ඇත. වියදම් වලට අදාළ සවිස්තරාත්මක ගොනු නඩත්තු කරනුයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.<br>මෙම වැඩසටහන ක්‍රියාත්මක වනුයේ මධ්‍යම පරිසර අධිකාරිය මගින් වන අතර එහි පරිසර නිලධාරීන් මගින් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන ව්‍යාපෘති අධීක්ෂණයට ලක්වන අතර, අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් ලේකම්වරුන් සම්බන්ධ කරගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ඇත.<br>පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහන "හරිත ව්‍යවසාය ප්‍රවර්ධනය මගින් පරිසර සංරක්ෂණ" වැඩසටහන යටතේ 2021 වර්ෂයේදී තෝරා ගත් ප්‍රතිලාභින් හට ගෙවීම සඳහා දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන ලබා දීමේදී 2021.12.30 දිනට ප්‍රතිපාදන ලබා දුන් ප්‍රතිලාභින්ගේ නම් ඇතුලත් වාර්තාවක් එවන ලෙස දන්වා ඇත. තවද 2022.02.03 දින හා 2022.02.17 දිනයන් හි දිස්ත්‍රික් ලේකම්වරුන් ගෙන් ප්‍රතිපාදන ලබා දිම සම්බන්ධ නැවත විමසිමක් සිදුකරන ලදි. මේ වන විට ප්‍රතිපාදන ගෙවිම සම්බන්ධව වාර්තා අදාල දිස්ත්‍රික් 17 න්ම ලැබී ඇත. | ව්‍යාපෘති ප්‍රගතිය අඛණ්ඩව පරීක්ෂා කිරීමේ වගකීම නිලධාරියකු වෙත පැවරීම හා ඔහුගේ නිරීක්ෂණ මත පදනම්ව මුදල් නිදහස් කිරීම. |

**2.5 තැන්පත් ශේෂයන්**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් සම්බන්ධ භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුම යටතේ රු.30,737,540 ක ශේෂයක් වසර දෙකකට වැඩි කාලයක සිට පොදු තැන්පත් ගිණුමේ පෙන්නුම් කරන අතර මුදල් රෙගුලාසි 570(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | **CECB** ආයතනය විසින් ඉදිරිපත් කර ඇති සියළු බිල්පත් සඳහා ගෙවීම් සිදු කර ඇති අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් අවසාන බිල්පත සහතික කර ගැනීමෙන් පසු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104(1) (4) | හානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 මාර්තු 31 දින වන විටත් අමාත්‍යාංශය සතු වාහන 02 ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | මෙම වාහන සම්බන්ධයෙන් මු.රෙ.104 අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තා යැවීමට කටයුතු කර ඇත. රටේ පවතින වර්තමාන තත්ත්වය හේතුවෙන් වෙළඳපලෙහි වාහන අමතර කොටස් හිඟතාවය නිසා අලුත්වැඩියා කටයුතු අවසන් කිරිම ප්‍රමාද වී ඇත. අවසන් වාර්තාව සකස් කිරිම සඳහා වාහන අලුත්වැඩියාව අවසන් කිරිමෙන් පසු ලැබෙන බිල්පත් වටිනාකමට අදාල තොරතුරු එම වාර්තාවෙහි සඳහන් කිරිමට අවශ්‍ය බැවින් | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අවසන් වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇත. | |
| (ආ) 2017 දෙසැම්බර් 31 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2018 ජුනි 30 දිනට පෙර රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතාකරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියා පදිංචි කළ යුතුව තිබුණද පරිසර අමාත්‍යාංශය භාවිතා කරන වාහන 03 ක් අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එක් වාහනයක ලියාපදිංචි පොතෙහි පිටපත් රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කොට ඇති අතර ව පරිසර අමාත්‍යාංශයට නීත්‍යානුකූලව පවරා දීමට අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා ඇත. ජීප් රථය පවරා දෙන මෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වෙත දන්වා ඇත. ජීප් රථය පවරා ගැනීම සඳහා ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් අමාත්‍යාංශය වෙතින් ඉල්ලීමක් කර ඇති අතර, පිළිතුරක් ලැබී නොමැති බැවින් හා අමාත්‍යාංශ නාමයන් සංශෝධනය වීම හේතුවෙන් මෙම ජීප් රථය පවරා ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙතින්ද ඉල්ලීමක් කර ඇත. | නීත්‍යානුකූලව පවරා ගැනීමට අදාල කටයුතු සිදු කල යුතුය. |

## 2.7 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම පළාත් කාර්යාලයේ පළමු මහලේ ඉදිකිරීම (160-02-03-137-2104(11) ) සඳහා 2021 අගෝස්තු 09 දින අමාත්‍යාංශය විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත රු.5,000,000ක මුදලක් ලබා දී තිබුණද අදාල කටයුත්ත සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී තිබුණේ 2021 ඔක්තෝබර් මස 06 දින වේ. මේ අනුව අදාල කාර්යය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමට පෙර මුදල් නිදහස් කර දීම සිදු කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නීත්‍යානුකූල අනුමැතියකින් පසුව මුදල් නිදහස් කිරීම කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 මැයි 25 දිනැති අංක අමප21/0833/321/007/ දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍යාංශය ක්‍රියාත්මක කර තිබූ හරිත ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මඟින් පරිසර සංරක්ෂණය වැඩසටහන වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දරා තිබූ වියදම රු. 36,462,821 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | රට තුල පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතියේ කටයුතු අඩාල වූ අතර තෝරා ගත් ප්‍රතිලාභීන් සඳහා රුපියල් මිලියන 50 ක ප්‍රතිපාදන නිදහස් කලද අවශ්‍ය අක් මුදල් භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් පරිදි නිදහස් නොවීම නිසා මෙම ප්‍රතිපාදනය ඉතිරි වී ඇත. මෙම ව්‍යාපෘතිය 2021 වර්ෂයේ පැවති අඩුපාඩු හඳුනාගෙන මෙම වර්ෂයේ දී තවදුරටත් ක්‍රියාත්මක වේ. | ව්‍යාපෘති ප්‍රගතිය අඛණ්ඩව පසු විපරම් කිරීම හා ප්‍රගති වාර්තා ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 වෙනත් නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 – 2030 වර්ෂ වෙනුවෙන් ජාතික පාරිසරික ක්‍රියාකාරි සැලැස්ම විගණිත දිනය වන විටත් කෙටුම්පත් තත්ත්වයේ පැවති බව නිරීක්ෂණය විය. | මුද්‍රණය සඳහා ලබා දී ඇත. | සැලැස්ම ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජනාධිපති ලේකම්ගේ 2019 දෙසැම්බර් 19 දිනැති හා අංක PS/SP/SB/Circular/06/2019 දරන චක්‍රලේඛයේ 2 වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති සම්බන්ධයෙන් අවසන් වශයෙන් අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලබා ගැනීමකින් තොරව තවදුරටත් කිසිදු බැඳීමක් ඇතිකර ගැනීම හෝ අවබෝධතා ගිවිසුම් හෝ ගිවිසුම්වලට එළඹීමෙන් | රසදිය භාවිතය මිශ්‍ර අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ජාතික ධාරිතා වර්ධනය කිරීම සහ "ලෝකනාථ රස " ඖෂධය භාවිතය පිළිබඳ අධ්‍යනය යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙහි අනුමැතීන් ලබා දී තිබූ අතර ව්‍යාපෘති ගිවිසුම සඳහා | ගිවිසුම්ගත වීමට ප්‍රථම අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

වැළකී සිටිය යුතු විය. එහෙත් අමාත්‍යාංශය විසින් රසදිය භාවිතය අවම කිරීම සඳහා ජාතික ධාරිතාවය ශක්තිමත් කිරීම මඟින් ශ්‍රී ලංකාවේ රසදිය අඩංගු අපද්‍රව්‍ය පරිසර හිතකාමී ලෙස කළමනාකරණය කිරීම, අක්මා සෛල පිළිකා තත්ත්වය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් අක්මා ආරක්ෂාකාරී ප්‍රතිකාර ක්‍රමයක් ලෙස රසදිය අඩංගු " ලෝකනාථ රස" ඖෂධ භාවිතය සහ ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුළින් වනාන්තර, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කළමනාකරණය කිරීම යන ව්‍යාපෘතීන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට පෙර ගිවිසුම්වලට එළඹ තිබුණි.

නීතිපති දෙපාර්තමේන්තුවෙහි අනුමැතිය 2021.03.02 දින ලබා දී ඇත. ඒ අනුව, අමාත්‍යාංශය අදාළ මූල්‍යාධාර ප්‍රදානය කරන ආයතන සමග ගිවිසුම්ගත වන ලදී.

එහෙත් ඉන් පසුව විදේශ අමාත්‍යාංශය විසින් අදාළ ව්‍යාපෘති ගිවිසුම් වල ඇතැම් වගන්ති සඳහා සංශෝධන සිදු කල යුතු බව දන්වා සිටි අතර මෙම අමාත්‍යාංශය විසින් ඒ පිලිබඳ අදාළ මූල්‍යාධාර ප්රදානය කරන ආයතන දැනුවත් කරන ලදී. එහිදී එකී ආයතන එම සංශෝධන සඳහා එකඟතාව පළ නොකළ හෙයින් මෙම ගැටලුකාරී තත්ත්වය විසඳා, ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරන ලදී. 2021.09.28 වන දින මෙම ව්‍යාපෘති සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණ. මේ වන විට උක්ත ව්‍යාපෘති වල ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරමින් පවතී.

ප්‍රජා පාදක පරිසර පද්ධති ප්‍රවේශය තුළින් වනාන්තර, කෘෂිකර්ම හා සංචාරක ක්ෂේත්‍ර ඒකාබද්ධව කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය ගෝලීය පහසුකම් යටතේ UNDP ආයතනය හරහා ලංකාවට ලැබුණු මූල්‍යාධාර ව්‍යාපෘතියක් වේ. ව්‍යාපෘතිය ලේඛණ සම්පූර්ණ කිරීමෙන් පසුව ව්‍යාපෘතිය සඳහා නිශ්චිත කාල වකවානු තුල ගිවිසුම්පත්‍ර අත්සන් කිරීම කල යුතුව තිබුණු අතර එසේ නොවුණහොත් අදාළ ව්‍යාපෘතිය අප රටට අහිමි වී යාමේ අවධානමක් ඇති වූ බැවින් ගිවිසුම්වලට එළඹීමට සිදුවිය. අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව මෙම ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු සිදු කරන ලද බව කාරුණිකව දන්වා සිටිමි.

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිසර අමාත්‍යාංශය සතු සංචිත වාහනවලින් වාහන දෙකක් ගරාජවල සහ වාහන තුනක් අමාත්‍යාංශ පරිශ්‍රයේ රඳවා ඇති බව අණාවරණය වූ අතර ගරාජයේ ඇති වාහන අවුරුදු හතරක් දක්වා වූ කාලයක් ද අමාත්‍යාංශ පරිශ්‍රයේ ඇති වාහන අවුරුදු දෙකක සිට අවුරුදු හතරක් දක්වා කාලයක් මුදල් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අලුත්වැඩියා කර නොතිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත අලුත්වැඩියා කිරිමට නොහැකි වීම, වෙළඳපොළෙහි වාහන අමතර කොටස් හිඟතාවය, වැනි හේතු නිසා අලුත්වැඩියා කටයුතු සිදු කිරිම ප්‍රමාද වී ඇත.<br>වාහන 02 ක් අපහරණය කිරිම සඳහා තක්සේරු වාර්තා ලබා ගෙන ඇති අතර වාහන අවශ්‍යතාවයන් පවතින රජයේ ආයතන වෙත ලබා දීමට සැලසුම් කර ඇත. | පසුවිපරම් කර කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ජේෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව 17 ක් විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය බැවින් එකී පුරප්පාඩු පිරවිම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය MISCO දත්ත පද්ධතිය හරහා හා ලිඛිතව වරින් වර දැනුවත් කිරිම් කර ඇත. | සේවා අවශ්‍යතා මත පවතින පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂය තුල අමාත්‍යාංශයේ ද්විතික මට්ටමේ තනතුරක් වූ සංවර්ධන නිලධාරී තනතුරුවල අතිරික්ත සංඛ්‍යාව දෙකක් විය. | සේවා අවශ්‍යතාවය මත පරිසර අමාත්‍යාංශය සඳහා දැනට අනුමත සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාවට වඩා සංවර්ධන නිලධාරින් 30 දෙනෙකු අනුමත කර දෙන මෙන් මු.රේ 71 යටතේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇත. තවද දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ ඉල්ලීම අනුව සෑම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් සඳහාම පරිසර නිලධාරියෙකු පත් කරන ලෙසට කර ඇති ඉල්ලීම සලකා පරිසර අමාත්‍යාංශය සඳහා සංවර්ධන නිලධාරි තනතුරු 391ක් ඇති කිරීම සඳහා මු.රෙ. 71 යටතේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන අත්‍යවශ්‍ය තනතුරු සංඛ්‍යාව පමණක් අඩංගු වනසේ තනතුරු සංඛ්‍යා සංශෝධනය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |